# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2142/74 - 2019 සැප්තැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත**

9 වන වගන්තිය යටතේ නියෝගය

ගරු අග්‍රාමාත්‍යවරයා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය, උතුරු පළාත් සංවර්ධනය හා තරුණ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින්, ''කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා පලාලි ගුවන්තොටුපළ සංවර්ධනය කිරීම'' යන මැයෙන් ඉදිරිපත් කරනු ලැබූ අංක 19/1799/105/009-II සහ 2019 ජුනි 24 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සළකා බැලීමෙන් අනතුරුව 2019 අගෝස්තු 06 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුකූලව, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය අර්ජුන රණතුංග වන මම, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 9 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කරනු ලබන මෙම නියෝගයෙන්, එම පනතේ දෙවන උපලේඛනයේ සඳහන් යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පවරා නතු කර දෙන බව මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ධාවනපථය, එම ධාවනපථයේ තීරුව සහ එම ධාවනපථයට යාබදව එයට උතුරු දෙසට වන්නට පිහිටි ගුවන්තොටුපළට අයත් සම්පූර්ණ භූමි භාගය.

අර්ජුන රණතුංග (පා.ම.),
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
සෙත්සිරි පාය අදියර II,
බත්තරමුල්ල,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ දී ය.

10 - 412

1A - G 31123 — 20 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*